# අනිච්ච යනු අනිත්‍යය යන අර්ථයයි එසේ නම් ‘කැමති නොවන’ අර්ථය වරදවා ගැනීමකි

## අනිච්ච යන වචනයේ අර්ථය

### 1. ත්‍රිපිටකය තුලින් නිර්වචනය

*‘කෙනට්ඨෙන අනිච්චා - උප්පාදවයට්ඨෙන අනිච්චා’*

කුමන අරුතින් අනිත්‍ය වේ ද - ඉපදී වැනසෙන අරුතින් අනිත්‍ය වෙයි.

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, ඛුද්දක නිකාය, පටිසම්භිදාමග්ගපකරණ 1, සතොකාරී ඥානය - පිටු අංක 364 - 365)

### 2. ශබ්දකෝෂ ඇසුරින්

- අනිච්ච - නිත්‍ය නොවන, සැම කල් නොපවතින
  (පාලි සිංහල ශබ්ද කෝෂය - මඩිතියවෙල සිරිසුමංගල ස්ථවිරයන් වහන්සේ)
- අනිච්ච - නිත්‍යය නොවූ, සැම කල්හි නොපවතින
  (පාලි සිංහල අකාරාදිය - පොල්වත්තේ බුද්ධදත්ත නායක ස්ථවිර)
- Anicca – unstable, Impermanent, inconstant
  [Pali Text Society (PTS) - Pali English Dictionary - Rhys Davids & William Stede]

අනිච්ච යන වචනයේ නිර්වචනය ත්‍රිපිටකය තුළ පැහැදිලි ව ම සඳහන් වෙයි. මෙයට අමතර ව ශබ්දකෝෂ කිහිපයක ඇති අර්ථය ද සඳහන් කළෙමු.

අනිච්ච යනු නිච්ච යන පදයේ විරුද්ධාර්ථය හඟවන පදයයි.

***‘අනිච්චෙ නිච්චන්ති සඤ්ඤා විපල්ලාසො’***

අනිත්‍යයෙහි නිත්‍ය යනු සංඥා විපල්ලාසයක් (වැරදි ලෙස ගත් හදුනා ගැනීමක්) වෙයි.

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, ඛුද්දක නිකාය, පටිසම්භිදාමග්ගප්පකරණ 1, විපල්ලාසකථා - පිටු අංක 506 - 507)

## නිච්ච හි අර්ථය

- නිත්‍ය වූ, සැමදා පවතින, වෙනස් නොවන

  (පාලි සිංහල අකාරාදිය - පොල්වත්තේ බුද්ධදත්ත නායක ස්ථවිර)

- නොනස්නා ලද්ද

  (පාලි සිංහල ශබ්ද කෝෂය - මඩිතියවෙල සිරිසුමංගල ස්ථවිරයන් වහන්සේ)

- Nicca - constant, continuous, permanents

  (PTS - Pali English Dictionary - Rays Davids & William Stede)

අනිච්ච හා අනිච්ඡ යනු වෙනස් වචන (නිරුක්ති) දෙකකි. එහි අකුරු ද වෙනස් වෙයි. අර්ථයන් ද එකිනෙකට වෙනස් වෙයි. මෙහි අවසන් අකුර ‘ච’ ලෙස අනිච්ච හි ද, ‘ඡ’ ලෙස අනිච්ඡ හි ද යෙදෙයි.

අනිච්ඡ යනු ඉච්ඡ/ඉච්ඡා යන පදයේ විරුද්ධාර්ථය හඟවන පදය වෙයි.

## ඉච්ඡා - නිවැරදි අර්ථය

### ත්‍රිපිටකය ඇසුරින්

- ඉච්ඡා - තණ්හාව, ආසාව

  (බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, මහානිද්දේස පාළි, ගුහට්ඨකසුත්තනිද්දෙසො - පිටු අංක 43)

### ශබ්දකෝෂ ඇසුරින්

- ඉච්ඡා - කැමැත්ත, ආශාව

  (පාලි සිංහල අකාරාදිය - පොල්වත්තේ බුද්ධදත්ත නායක ස්ථවිර)

- ඉච්ඡා - ආශාව, කැමැත්ත, තෘෂ්ණාව
  (පාලි සිංහල ශබ්ද කෝෂය, මඩිතියවෙල සිරි සුමංගල ස්ථවිරයන් වහන්සේ)
- Iccha – wishing , longing, having desires;
  (PTS - Pali English Dictionary - Rhys Davids & William Stede)

## ඉච්ඡා යන වචනයෙහි විරුද්ධාර්ථය හඟවන අනිච්ඡ/අනිච්ඡා හි ශබ්දකෝෂ අර්ථය

- අනිච්ඡ - ආසා රහිත, තණ්හා නැති
  (පාලි සිංහල ශබ්ද කෝෂය - මඩිතියවෙල සිරි සුමංගල ස්ථවිරයන් වහන්සේ)
- අනිච්ඡා - නොකැමැත්ත
  (පාලි සිංහල අකාරාදිය - පොල්වත්තේ බුද්ධදත්ත නායක ස්ථවිර)
- Aniccha – without desires, not desiring
  (PTS - Pali English Dictionary - Rhys Davids & William Stede)

එනම් අනිච්ච යනු අනිත්‍ය යන අර්ථය වෙයි.

අනිච්ඡ යනු කැමති නොවන යන අර්ථය වෙයි.

අනිච්ච හා අනිච්ඡ යන වචනවල අකුරු ද එකිනෙකට වෙනස් වෙයි. ඒවායේ අර්ථයන් ද එකිනෙකට වෙනස් වෙයි.

අනිච්ච යනු නිච්ච (නිත්‍ය) යන පදයේ විරුද්ධාර්ථය හඟවන පදය වෙයි.

අනිච්ඡ යනු ඉච්ඡ හෝ ඉච්ඡා යන පදවල විරුද්ධාර්ථය හඟවන පදය වෙයි.

## තවදුරටත් කරුණු හැදැරීමට අවශ්‍ය නම් පහත සඳහන් වන මූලාශ්‍ර භාවිත කරන්න

- රූපස්ස අනිච්චතා

  (බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, අභිධර්ම පිටකය, ධම්මසඞ්ගණිප්පකරණ - පිටු අංක 302, 324, 354)

- අනිච්චා

  (බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, අභිධර්ම පිටකය, විභඞ්ගප්පකරණ 2 - පිටු අංක 142)

- පුප්ඵ සූත්‍රය

  (බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, සංයුක්ත නිකාය 3 - පිටු අංක 238)

- ගොමයපිණ්ඩූපම සූත්‍රය

  (බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, සංයුක්ත නිකාය 3 - පිටු අංක 246)

- විපරීත කථා

  (බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, අභිධර්ම පිටකය, කථාවත්ථුප්පකරණ 2 - පිටු අංක 194)

- රූපං අනිච්චං ඛයට්ඨෙන (ලක්ඛණත්තිකනිද්දෙසො)

  (බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, ඛුද්දක නිකාය, පටිසම්භිදාමග්ගප්පකරණ 1 - පිටු අංක 68)

- ඉච්ඡා

  (බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, ඛුද්දක නිකාය, පටිසම්භිදාමග්ගපකරණ 1 - පිටු අංක 72)

- භඞ්ගානුපස්සනාඤාණං

  (බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, ඛුද්දක නිකාය, පටිසම්භිදාමග්ගපකරණ 1 පිටු අංක 108 - 111)